**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය - 2024**

---------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී .වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පෙර වර්ෂවල සිදු වූ වර්ගීකරණ දෝෂය නිවැරදි කිරීමේදී, යළි වර්ගීකරණය කරන ලද රු. 49,250,000 ක් වටිනා කොටස් ආයෝජන සහ වෙළඳ ණයගැතියන්ගේ සංසන්දනාත්මක තොරතුරු ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 08 හි 42 ඡේදය අනුව මූල්‍ය ප්‍රකාශනවල නැවත ප්‍රකාශ කර නොතිබුණි. | පසුගිය වසරේ විගණනය මගින් පෙන්වා දුන් පරිදි මූලික වර්ගීකරණය නිවැරදි කිරීම සඳහා සමාගමක ආයෝජනය කර තිබෙන රු.49,250,000 ක මුදලට සමාන මුදලක හානිකරණ ප්‍රතිපාදනය, කොටස් ආයෝජන සටහනෙන් ඉවත්කර වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ යටතේ වාර්තා කර තිබේ | ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව ශේෂයන් නැවත ප්‍රකාශ කිරීමෙන් පෙර කාලපරිච්ඡේද දෝෂ නිවැරදි කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 51 සහ 79 ඡේදවලට අනුව, වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ආයු කාලය වාර්ෂිකව සමාලෝචනය කර ගිණුම්ගත කළ යුතුය. කෙසේ වෙතත්, සම්පූර්ණයෙන්ම ක්ෂය කර අවසන් එහෙත් තවමත් භාවිතයේ පවතින දේපළ, පිරියත සහ උපකරණ අයිතම 3813 ක් තක්සේරු කර හෝ ගිණුම්ගත කර නොතිබුණි. | එකඟ වෙමි. හෙළිදරවු කෙරෙනු ඇත. | සම්පූර්ණයෙන්ම ක්ෂය කර අවසන් සහ තවමත් භාවිතයේ පවතින වත්කම් ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව වාර්ෂිකව සමාලෝචනය කර ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා අපනයනකරුවන්ගේ දායකත්වය, | එකඟ වේ. මෙම ගිණුම්කරණ පිළිවෙත මණ්ඩලයේ මූල්‍ය | අදාළ කරගෙන ඇති සියලුම ගිණුම්කරණ ප්‍රතිපත්ති |

| | | | |
|---|---|---|---|
| | ජාත්‍යන්තර මූල්‍ය සංස්ථා (IFC) අරමුදල සහ සම්මන්ත්‍රණ සහ පාඨමාලා ගාස්තු වෙතින් ලැබෙන ආදායම හඳුනා ගැනීම සඳහා සකස්කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 18 හි 35 වන ඡේදයට අනුව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ප්‍රකාශනවල වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පරිච්ඡේදයට ඇතුළත් කෙරේ. | ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව හෙළිදරව් කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලය විසින් රු.13,150,000 ක මුදලක් ආයෝජනය කර තිබෙන පෞද්ගලික සමාගමක 1,413,772 ක කොටස් සංඛ්‍යාවක වෙළඳපල වටිනාකම 2024 දෙසැම්බර් 31 දිනට රු.158,639,356 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති අතර එය 2022 දෙසැම්බර් 31 දිනට කොටස්වල වෙළඳපල වටිනාකම විය. කෙසේ වෙතත්, 2024 දෙසැම්බර් 31 දිනට වෙළඳපල වටිනාකම 2022 දෙසැම්බර් 31 දිනට වෙළඳපල වටිනාකමට සමාන බවත්, කොටස්වල වෙළඳපල වටිනාකම ගණනය කිරීමේ පදනමේ නිරවද්‍යතාවයත් විගණනයට තහවුරු කර නොතිබුණි. | සමාගමේ වෙළඳපල වටිනාකම, සමාන ලැයිස්තුගත සමාගමක වෙළඳපල වටිනාකම හරහා ලබා ගත නොහැකි විය. වත්කම් හානි වීම පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 36 අනුව කොටස් තක්සේරුව සිදු කෙරේ. ලයිස්තුගත නොවන සමාගම්වල සිදු කරනු ලබන කොටස් ආයෝජන පිරිවැය ආකෘතියට අනුව පවත්වාගනු ලැබේ. මෙම ගිණුම්කරණ පිළිවෙත මූල්‍ය ප්‍රකාශනවල වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පරිච්ඡේදයට ඇතුළත් කරනු ලැබේ. | පිළිගත හැකි ක්‍රමවේදයක් භාවිතා කරමින් කොටස්වල වෙළඳපල වටිනාකම ගණනය කළ යුතුය. |
| (ආ) | ඊළඟ වසරට අදාළ IFC අරමුදලේ ආදායම, රු.2,506,145 ක් වූ අතර, එය සමාලෝචිත වර්ෂයේ ආදායම ලෙස හඳුනා ගැනීම සහ සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා අපනයනකරුවන්ගේ දායකත්ව ආදායම සහ IFC අරමුදල් ආදායම යන දෙකම යටතේ රු.14,087,416 ක් සටහන් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම රු.16,593,561 කින් වැඩියෙන් සඳහන් කර තිබුණි. | පිළිගනිමි. IFC ආදායමේ රු. 2,506,145 ක් සහ අපනයනකරුවන්ගේ දායක ආදායමේ ගිණුම රු. 14,087,416 ක් ලෙස සංවර්ධන වියදම් ගිණුම්වල ගිණුම්ගත කිරීමේ දෝෂ නිවැරදි කරන්නෙමු. ශුද්ධ බලපෑම මගින් ශුද්ධ අතිරික්තයට බාධාවක් නැත. | ගිණුම් වර්ෂයට අදාළ ආදායම මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව දැක්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | විදේශීය වෙළඳ ප්‍රදර්ශන වියදම් සහ වෙළඳ තොරතුරු සහ සේවා වියදම් පිළිවෙලින් රු.9,400,597 කින් සහ රු.2,506,145 කින් වැඩිපුර දක්වා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, සමාලෝචිත වර්ෂය සඳහා අපනයන සංවර්ධන වියදම් රු.11,906,742 කින් වැඩිපුර දක්වා තිබුණි. | පිළිගනිමි. IFC ආදායම රු. 2,506,145 ක් සහ අපනයනකරුවන්ගේ දායකත්ව ආදායම් ගිණුමේ රු. 9,400,597 ක් වූ ගිණුම්කරණ දෝෂය අදාළ සංවර්ධන වියදම් ගිණුම සමඟ නිවැරදි කරන්නෙමු. | ගිණුම් වර්ෂයට අදාළ වියදම් මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව දැක්විය යුතුය. |
| (ඇ) | ලෙජරයට අනුව, Biofach වෙළඳ ප්‍රදර්ශනය සඳහා අපනයනකරුවන්ගේ දායකත්වය රු.24,926,297 ක් වූ අතර උපලේඛනය අනුව එය රු.25,825,297 ක් විය. ඒ අනුව එම ශේෂ දෙක අතර රු.899,000 ක වෙනසක් නිරීක්ෂණය විය. | පිළිගනිමි. 2023 දී පුරෝකථනය කරන ලද මුදල 2024 දී වැඩි නොවනු ඇතැයි උපකල්පනය කරන ලද අතර එබැවින් ඉතිරිය ඉදිරියට ගෙන යන ලදී. | ලෙජර් ගිණුම් සහ අදාළ උපලේඛන අනුව ශේෂයන් සැසඳිය යුතුය. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම.

| | අයිතමය | මුදල රු. | නොසැපයූ සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | කොටස් ආයෝජන | 34,581,905 | කොටස් සහතික | එකඟ වෙමි. මෙම තත්ත්වය හඳුනාගෙන ඇති අතර විගණන කමිටුවේ උපදෙස් අනුව, අභ්‍යන්තර විගණකවරයා විසින් මේ සම්බන්ධයෙන් පරීක්ෂණ ආරම්භ කර ඇත. විගණන කමිටුවේ මතය ලැබීමෙන් පසු, අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබා ගැනීමට අපනයන සංවර්ධන මණ්ඩලය කැමැත්තෙන් සිටී. | සෑම ගනුදෙනුවක් සඳහාම අදාළ ලිඛිත සාක්ෂි තබා ගත යුතු අතර විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | කොටස් ආයෝජනවල හානිකරණය | 34,423,710 | කොටස් සහතික | | |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලය විසින් අපනයනකරුවන්ට ලබා දුන් අපනයන ණය, රු. 37,984,520 න් සමාලෝචිත වසරේ දෙසැම්බර් 31 දිනට අපනයනකරුවන් 146 | අපනයන සංවර්ධන මණ්ඩලයේ නිලධාරීන් මෙම සමාගම්වල පැවැත්ම තහවුරු කර ගැනීම සඳහා පෞද්ගලිකව ඒවායේ ලිපිනයන්ට ගොස් ඇති අතර, | අපනයන ණය ශේෂයන් අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දෙනෙකුගෙන් රු. 36,788,520 ක මුදලක් ලැබිය යුතුවිය. ඒ අනුව, එම මුදලින් සියයට 97 ක් වසර 26 කට අධික කාලයක සිට අයකර ගෙන නොතිබුණි. | මෙම සමාගම් සොයා ගැනීමට සහ හිඟ ශේෂය අයකර ගැනීම සඳහා පවතින ණය පැහැර හරින ලද සමාගම්වලට එරෙහිව නීතිමය පියවර ගැනීමට ප්‍රාදේශීය ලේකම්වරුන්ට සහ ග්‍රාම නිලධාරීන්ට ලිඛිතව දැනුම් දී තිබේ. ණය කපා හැරීමට අනුමැතිය ඉල්ලා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් 2023 මාර්තු 08 දිනැති ලිපිය භාණ්ඩාගාරයට යවා ඇත. | |
| (ආ) | ඌව පරණගම අපනයන නිෂ්පාදන ගම්මාන (UPEPV) වැඩසටහන යටතේ ගොවීන්ට ලබා දී තිබූ රු.10,403,683 ක ණය ශේෂය වසර 15කට අධික කාලයක සිට අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. | අපනයන සංවර්ධන මණ්ඩලය විසින් අපනයන සමාගම් වලින් විකුණුම් ආදායම එකතු කර, ගෙවිය යුතු ණය වාරික භාණ්ඩාගාරයට ප්‍රේෂණය කරන ලද අතර, සපයන ලද නිෂ්පාදන සඳහා වගාකරුවන්ට ගෙවීම් සහ පරිපාලන සහ අනෙකුත් වියදම් සඳහා අවශ්‍ය අරමුදල් සමාගමට ප්‍රේෂණය කරන ලදී. | ණය ශේෂ අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |
| (ඇ) | වසර 15 කට වැඩි කාලයක සිට අනෙකුත් ණයගැතියන්ගෙන් අයවිය යුතු රු. 8,131,218 ක මුදලක් අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. | අපනයන සංවර්ධන මණ්ඩලය විසින් කරන ලද ආයෝජනය සඳහා සමාගමේ කොටස් වලින් සියයට 20 ක් ප්‍රදානයක් මෙන්ම ණය මුදලක් ලෙස ලබා දෙන බව එක් සමාගමක් විසින් මණ්ඩලය වෙත ලිපියක් මගින් දන්වා ඇති අතර සමාගම් 3 කින් ණය මුදල අයකර ගැනීම සඳහා මණ්ඩලය විසින් අධිකරණයේ නඩු තුනක් ගොනු කර ඇත. | ණයගැතියන්ගෙන් ශේෂයන් අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |
| (ඈ) | වසර 08 සිට වසර 26 දක්වා කාලයක් ගත වී ඇතත් ආයතන 07 කින් සේවා ලබා ගැනීම සඳහා කරන ලද රු. 901,000 ක තැන්පතු මුදල් මණ්ඩලය වෙත අයකර ගෙන නොතිබුණි. | පිළිතුරු දී නැත | සේවා ලබා ගැනීම සඳහා කරන ලද තැන්පතු අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 2(1) සහ 102 වගන්ති | ආදායම් බදු සඳහා ලියාපදිංචි වීමට හෝ බදු නිදහස් කර ගැනීමට මණ්ඩලය පියවර ගෙන නොතිබුණි. | පිළිතුරු දී නැත. | ලියාපදිංචි වීමට හෝ බදු නිදහස් කර ගැනීමට පියවර ගත යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ VIII පරිච්ඡේදයේ 6.1 ඡේදය | අනුමත අතිකාල ගෙවීම් අනුපාතය පැයකට මූලික වැටුපෙන් 1/240 ක් වුවද, මණ්ඩලය විසින් භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව මූලික වැටුපෙන් 1/120 ක අනුපාතයක් යොදාගෙන තිබෙන අතර, සමාලෝචිත වර්ෂය තුළ අතිකාල සහ නිවාඩු දින ගෙවීම් ලෙස රු. 7,590,234 ක් ගෙවා තිබුණි. | පිළිගනිමි. වර්තමානයේ දී 2025/03/25 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 1/2025 මත පදනම්ව අතිකාල ගෙවීම් සිදු කර ඇත. | වැඩිපුර ගෙවන ලද අතිකාල සඳහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබා ගත යුතුය. |
| (ඇ) | 2015 මැයි 25 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2015 | ප්‍රවාහන දීමනාව සඳහා සුදුසුකම් නොලබන PL, MA සහ JM සේවා කාණ්ඩ යටතේ සේවය කරන සේවකයින් 166 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලය විසින් රු. 15,545,690 ක මුළු ප්‍රවාහන දීමනාවක් ගෙවා තිබුණි. | සටහන් කර ගන්නා ලදී. අපනයන සංවර්ධන මණ්ඩලය විසින් 1988 වර්ෂයේ සිට JM, MA සහ PL යන සේවක කාණ්ඩ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පදනම්ව ප්‍රවාහන දීමනාව ගෙවනු ලැබේ. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව සුදුසුකම් ලබන සේවකයින් සඳහා පමණක් ප්‍රවාහන දීමනා ගෙවිය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2024 දෙසැම්බර් 30 දිනැති TO/CFM/2023/Miscellaneous අංක දරන ලිපියේ 03 ඡේදය | භාණ්ඩාගාරය විසින් අරමුදල් නිකුත් කරනු ලැබුවද අපේක්ෂිත කාර්යය වර්ෂය තුළ සම්පූර්ණ කර නොමැති නම් හෝ අදාළ කාර්යය සම්පූර්ණ කිරීමෙන් පසු භාවිතයට නොගත් ශේෂයක් තිබේ නම්, එම අරමුදල් මූල්‍ය වර්ෂය අවසන් වීමට පෙර භාණ්ඩාගාරයට ආපසු යැවිය යුතුය. කෙසේ වෙතත්, වර්ෂය තුළ ලැබුණු නමුත් ප්‍රයෝජනයට නොගත් රු. 27,077,846 ක මුදලක් වෙනත් ප්‍රදාන වෙත මාරු කර රඳවා ගෙන තිබුණි. | 2025 දී පැවැත්වීමට නියමිත වෙළඳ ප්‍රදර්ශන සඳහා අවශ්‍ය අත්තිකාරම් ගෙවීම් සඳහා මෙම මුදල යොදා ගන්නා ලදී. | භාණ්ඩාගාරයෙන් ලබා දෙන අරමුදල් අරපිරිමැස්මෙන් භාවිතා කළ යුතු අතර භාවිතයට නොගත් අරමුදල් භාණ්ඩාගාරයට ආපසු ලබා දිය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 71,711,399 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 77,657,726 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.5,946,327 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ආදායම රු.190,504,483 කින් වැඩි වුවද, ආශ්‍රිත සමාගමේ කොටස් ලාභය රු.18,545,952 කින් අඩු වීම, අපනයන සංවර්ධන වියදම් රු.153,721,485 කින් වැඩිවීම සහ අනෙකුත් ආදායම් රු.23,992,426 කින් අඩුවීම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලය ආයෝජනය කර ඇති සමාගම් සම්බන්ධයෙන් පැවැත්ම පිළිබඳ සාක්ෂි නොමැති වීම හේතුවෙන් සමාගම් 26 ක සාමාන්‍ය කොටස්වල | එකඟ වෙමි. මෙම තත්ත්වය අප විසින් හඳුනාගෙන තිබෙන අතර විගණන කමිටුවේ උපදෙස් අනුව, අභ්‍යන්තර විගණකවරයා විසින් මේ සම්බන්ධයෙන් පරීක්ෂණ | ඵලදායී හා කාර්යක්ෂම ආයෝජන තීරණ ගැනීම සඳහා මණ්ඩලය විසින් ආයෝජනය කර තිබෙන සමාගම්වල පැවැත්ම සම්බන්ධයෙන් පසු විපරම් |

| | | |
|---|---|---|
| රු. 5,614,330 ක් සහ වරණීය කොටස්වල රු. 34,602,698 ක් වශයෙන් සිදුකර තිබූ ආයෝජන ආපසු ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබිණි. සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවෙන් ලද තහවුරු කිරීමට අනුව, මෙම සමාගම් 26 සමාගම් ලැයිස්තුවේ නොතිබුණි. | ආරම්භ කර තිබේ. එම මතය ලැබීමෙන් පසු, අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබා ගැනීමට අපනයන සංවර්ධන මණ්ඩලය කැමැත්තෙන් සිටී. | ක්‍රියා පටිපාටි අනුගමනය කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 සිට 2022 දක්වා කාලය තුළ වෙළඳපොළ ප්‍රවේශ සහාය වැඩසටහන යටතේ ව්‍යාපාරික සංවිධාන 103 කට රු. 231,424,708 ක මුදලක් මණ්ඩලය විසින් ප්‍රදානය කර තිබුණි. එයින්, රු. 72,479,504 ක් ප්‍රදානය කරන ලද ව්‍යාපාරික සංවිධාන 29 ක් එම කාලය තුළ අපනයන කටයුතුවල නියැලී සිටි බව විගණනයට තහවුරු නොවුණි. තවද රු. 9,674,300 ක් ප්‍රදානය කරන ලද සංවිධාන 05 ක් සහ රු. 1,796,531 ක් ප්‍රදානය කරන ලද සංවිධාන 05 ක් පිළිවෙලින් වසර 01 ක් සහ වසර 02 ක් පමණක් අපනයන කටයුතුවල නියැලී තිබුණි. 2022 දෙසැම්බර් මාසයේදී වැඩසටහන අවසන් කිරීමෙන් පසු මණ්ඩලය විසින් අඛණ්ඩ පසු විපරම් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම යෝජනා ක්‍රමය සාර්ථකව KPI අත්කර ගත්තද, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාලය තුළ මුහුණ දුන් අනපේක්ෂිත අභියෝග හේතුවෙන් හඳුනාගත් සමාගම් කිහිපයකට අපේක්ෂාවන් සපුරාලීමට නොහැකි විය. කෙසේ වෙතත්, ඒවායින් ඇතැම් ඒවා වක්‍ර අපනයන වන අතර සමාගම් කිහිපයක් ශ්‍රී ලංකා රේගුවේ සංඛ්‍යා ලේඛනවල සටහන් නොවන සේවා අපනයනකරුවන් වේ. | වැඩසටහනේ ප්‍රගතිය ඇගයීම සඳහා මණ්ඩලය විසින් ප්‍රමාණවත් පසු විපරම් ක්‍රියා පටිපාටියක් අනුගමනය කළ යුතුය. |

### 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ඉල්ලා සිටි අනුමැතිය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් ලබා දී නොතිබිය දී සියයට 4.2 ක පොලී අනුපාතයක් සහිත ණය කාණ්ඩ හතරකින් සමන්විත කාර්ය | එකඟ වේ. අපනයන සංවර්ධන මණ්ඩලය විසින් 2005 දක්වා මෙම යෝජනා ක්‍රමය අඛණ්ඩව පවත්වාගෙන ගොස් තිබේ. සියලුම මණ්ඩල සහ සංස්ථා | සහනදායී පොලී අනුපාතයක් සහිත කාර්ය මණ්ඩල ණය යෝජනා ක්‍රමය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ |

| | | |
|---|---|---|
| මණ්ඩල ණය යෝජනා ක්‍රමය 1985 වර්ෂයේ සිට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය යටතේ ක්‍රියාත්මක වෙමින් පැවතුණි. | සඳහා වෙනම චක්‍රලේඛයක් නිකුත් කරන බව භාණ්ඩාගාරය විසින් සඳහන් කර තිබෙන බැවින්, 2005 දෙසැම්බර් මාසයේ සිට මෙම යෝජනා ක්‍රමය නතර කරන ලදී. මණ්ඩලය විසින් භාණ්ඩාගාරය වෙත ලිපි කිහිපයක් යවා තිබෙන අතර කිසිදු ප්‍රතිචාරයක් ලැබී නොමැත. ඉන්පසුව මණ්ඩලය විසින් 2007 මාර්තු මාසයේදී අපනයන සංවර්ධන හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් උපදෙස් ලබා ගත් අතර ඔහු විසින් නිවාස ණය දිගටම කරගෙන යාමට කැමැත්ත පළකර තිබෙන අතර ඒ මත පදනම්ව, මණ්ඩලය ණය දිගටම ලබා දීමට අනුමැතිය ලබා දී ඇත. මණ්ඩලය විසින් නිවාස ණය යෝජනා ක්‍රමය ද අඩංගු වන පරිපාලන අත්පොත 2018 මැයි 30 වන දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. | අනුමැතිය ලබා ගත යුතු අතර, අනුමැතියකින් තොරව ණය යෝජනා ක්‍රමය අඛණ්ඩව කරගෙන නොයා යුතුය. |
| (ආ) විශ්‍රාම යාමේදී හෝ සේවයෙන් ඉල්ලා අස්වීමේදී ස්ථිර තනතුරක වසර 25ක් සම්පූර්ණ කළ සේවකයින් 03 දෙනෙකුට මණ්ඩලය විසින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව පවුම් භාගයක රන් කාසි තෑගි කරන තිබූ අතර, සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලය විසින් ඒ සඳහා රු.342,844 ක මුදලක් වැය කර තිබුණි. | වසර 25ක සේවා කාලයක් සම්පූර්ණ කළ පුද්ගලයෙකුට රන් පවුමක් තෑගි කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී ඇතත්, අපනයන සංවර්ධන මණ්ඩලය විසින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගන්නා තෙක් 2025 ජනවාරි සිට එහි ක්‍රියාකාරීත්වය අත්හිටුවා තිබේ. | කාර්ය මණ්ඩලය සඳහා එවැනි ත්‍යාගයක් වෙනුවෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතුය. |